# ආලින්දයේ පිළිසඳර කැඩපත

## ඕස්ට්‍රේලියාවේ නවතම ශ්‍රී ලාංකික මාසික සඟරාව දොරට වඩියි




රටකින් රටකට සංක්‍රමණය වීමේ ඉතිහාසය මානව ශිෂ්ඨාචාරයේ ආරම්භය දක්වාම ඇදී යතැයි අපි විශ්වාස කරමු. එකල දඬු මුගුරු අතැතිව, යහමින් ආහාර පාන සොයා මිනිසුන් තැනකින් තැනකට සංක්‍රමණය වූහ. අද අපි දඬු මුගුරු වෙනුවට උගත් ශිල්ප ශාස්ත්‍ර කරපින්නාගෙන වඩාත් හොඳ ජීවිතයක් සොයා කරනු ලබන සංක්‍රමණයද එකල සිටි සංක්‍රමණිකයෙකුගේ අපේක්ෂාවන්ගෙන් වෙනස් වූ දෙයක් යැයි නොසිතමු. ඒ කෙසේ වුවද මුල හා අග හරියාකාරව ගැට ගසා නොගතහොත් සංක්‍රමණිකයාගේ සිහින, සිහින ලෝක වලටම පමණක් සීමා විය හැකිය. ඒ නිසාම ඕස්ට්‍රේලියාවේ වෙසෙන සියලු ශ්‍රී ලාංකික සංක්‍රමණිකයින්ගේ යහපත, සුභසිද්ධිය සහ අප සියලු දෙනාගේම ඒකායන බලාපොරොත්තුව වන තෘප්තිමත් ජීවිත නැමති සිහිනය සැබෑ කරගැනීම වෙනුවෙන් ඇප කැප වීම කැඩපතේ කාර්‍යභාරයයි. අපි සියලු සෞන්දර්‍යාත්මක, කලාත්මක සහ නිර්මාණශීලී දේ අගයමු. ජාති ආගම් භේදයකින් තොරව මානව හිතවාදී සොඳුරු මිනිසුන් අගය කරමු. දැණුම සහ අවබෝධය තෘප්තිමත් ජීවිතයක පදනම යැයි අපි සිතමු. සියල්ලටම වඩා අපි අපගේ පාඨකයන්ගේ හදවත් වලට කථා කිරීමට නිරතුරුවම වෙහෙස ගන්නෙමු. කැඩපත ඔබේත් මගේත් ජීවිත තව තවත් ලස්සන කරගැනීමට උපකාරීවන සැබෑ කැඩපතක්ම වනු ඇතැයි අපි උදක්ම බලාපොරොත්තු වෙමු.

කැඩපත ඕපපාතිකව උපන් සඟරාවක් නොවේ. බොහෝ කාලයක් බොහෝ මිනිසුන් සහ දහසකුත් එකක් මුද්‍රිත මාධ්‍ය දෙස අවධානය යොමු කොට හෙට දවස වෙනුවෙන් වෙනස්ම දර්ශනයක් මත පදනම් වී එළිදැක්වනු ලැබූ සඟරාවකි එය. අපගේ එකම ඉලක්කය ඔබේ ආලින්දයේ සුන්දර පිළිසඳරකට සුදුසු වටපිටාවක් සැකසීමයි. විටෙක අප බොහෝ බොළඳ විය හැකිය. තවත් විටෙක දාර්ශනික විය හැකිය. සැබෑ ජීවිතයේදී වුවද අපේ ගමන් මග වැටී ඇත්තේ මෙබඳු වූ ආකාරයකට නොවේද ? බඩගාගෙන හෝ දණගාගෙන හෝ හැරමිටියෙන් හෝ නොවේ නම් අදිසි ලෙස වුවද අපි ඔබේ ආලින්දයට ගොඩ වැදෙන්නෙමු. ඒ අන් කිසිවක් නිසා නොව ඔබේ නිවසේ දැල්වෙන පහන අපේ ජීවිතයද එකලු කරන නිසාවෙනි.

කාලය තරම් වේගයකින් ගෙවී යන දෙයක් නැති බව ශතවර්ෂ 26 කට පෙර බුදුරජාණන් වහන්සේ පවා වදාළහ. එකල මෙන් නොව මෙකල කාලය ගෙවී යන්නේ ඊටත් වඩා වැඩි වේගයකිනි. අප ජීවත් වෙන බව පවා නොපෙනෙන තරමටම අපි කලබලකාරී වෙමු. නිරන්තර හදිසියකින් මෙන් කටයුතු කරමු. රැකියා දෙකක්වත් නොකර ණයතුරුස් ගෙවා දැමීම දුෂ්කරය. දරු දැරියෝ ලොකු මහත් වන්නේ බලා සිටියදීය. විශ්‍රාම ගිය දාටවත් අපට හුස්මක් කටක් ගන්නට හැකි වේදැයි සැක සහිතය. මෙවැනි දියුණු යැයි සම්මත සමාජයක පවා විශ්‍රාම සුවයෙන් පසුවන්නෝ අල්පයහ. කවර හෝ පිනකින් අපට විශ්‍රාම සුව ලැබුනේ නම් එදාට අප දෙපා වාරු නැති වනු ඇත. කැඩපත සමාජ ගත වන්නේ මේ කලබලකාරී, නූතන වැඩවසම් ක්‍රමයෙන් ඔබව ගලවා ගැනීමට නොවේ. ඔබත් මමත් ජීවත් වන බව මතක් කර දීමට - ගැනීමට - පමණි. අප එය කරන්නේ කවරාකාරයෙන්ද යන්න වටහා ගැනීමට අවම වශයෙන් වසරක් හෝ අප හා රැදී ඉන්නා ලෙස අපි ඔබගෙන් කාරුණිකව ඉල්ලා සිටිමු.

කැඩපත ඕපපාතිකව උපන් සඟරාවක් නොවේ. බොහෝ කාලයක් බොහෝ මිනිසුන් සහ දහසකුත් එකක් මුද්‍රිත මාධ්‍ය දෙස අවධානය යොමු කොට හෙට දවස වෙනුවෙන් වෙනස්ම දර්ශනයක් මත පදනම් වී එළිදැක්වනු ලැබූ සඟරාවකි එය. අපගේ එකම ඉලක්කය ඔබේ ආලින්දයේ සුන්දර පිළිසඳරකට සුදුසු වටපිටාවක් සැකසීමයි. විටෙක අප බොහෝ බොළඳ විය හැකිය. තවත් විටෙක දාර්ශනික විය හැකිය. සැබෑ ජීවිතයේදී වුවද අපේ ගමන් මග වැටී ඇත්තේ මෙබඳු වූ ආකාරයකට නොවේද ? බඩගාගෙන හෝ දණගාගෙන හෝ හැරමිටියෙන් හෝ නොවේ නම් අදිසි ලෙස වුවද අපි ඔබේ ආලින්දයට ගොඩ වැදෙන්නෙමු. ඒ අන් කිසිවක් නිසා නොව ඔබේ නිවසේ දැල්වෙන පහන අපේ ජීවිතයද එකලු කරන නිසාවෙනි.

සැම දිනයක්ම අළුත් දිනයක් වන්නට නම් අළුත් අළුත් දේ අප දැන උගත යුතුය. ඒ සඳහා අතීතය, වර්තමානය හෝ අනාගතය ඇවිස්සීමට කැඩපත සූදානම්ව සිටී. අනාදිමත් කාලයක පටන් අප ගතකරමින් සිටින සංක්‍රමණික ජීවිත වල සැබෑ සතුට ඇත්තේ මේ මොහොතේ පමණක් බව අපි අදහමු. කලබලකාරී වුවද, අසහනකාරී වුවද අප හා මදකට එක්වී ජීවිතය විනිවිද දකින ලෙස කැඩපත ඉතා කාරුණිකව ඔබෙන් ඉල්ලා සිටිමු. මිළියනයක් කථා ඔබට කියන්නට අපි මිළියන විසි දෙකක් කථා අසන්නට සූදානමින් සිටින්නෙමු.

ඕස්ට්‍රේලියාවේ දැනට ප්‍රකාශයට පත් කරන සියලු ශ්‍රී ලාංකික පුවත් පත් වලට අපි හිස නමා ආචාර කරමු. මන්ද යත් ඒවා බිහිවීමේ පරමාර්ථයන් අතිශ්‍ය නිර්ව්‍යාජ වූ බවට අප තුළ පවතින බලවත් විශ්වාසයත්, අප ඒවා ඇසුරු කිරීමෙන් සහ ඒවා සමඟ එක්ව කටයුතු කිරීමෙන් දැන උගත් පාඩම්ය. එසේ වූ පමණින්ම කැඩපත කිසිසේත්ම අනුකරණවාදී සඟරාවක් නොවේ. අප විසින් තෝරා බේරාගත් මගක් තිබේ. එය ඉතා සීරු මාරුවට අධ්‍යයනය කළ එකකි. අප යන්නේ ඒ මගය. එය ගතානුගතික අදහස් වලන් හෝ පස්චාත් නූතනවාදී අදහස් වලින් නොසෙළවිය හැකි එකකි. එය එසේ වුවද අපි අපේ මුතුන් මිත්තනට හිස නමා ගරු කරමු. තරුණ පරපුරද අගය කරමු.

කවර ව්‍යාපාරයකට වුවද ලාභාපෙක්ෂාවෙන් තොරව පැවතීම දුෂ්කර කටයුත්තක් වුවද කැඩපත කිසිවිටෙක මුදල නම් සාධකය ඉදිරියේ හෝ ආත්මය, මාධ්‍ය ආචාර ධර්ම හෝ සාරධර්ම පාවා නොදෙනු ඇත. අප යන ගමන නිවැරදිව වටහා ගෙන අපට කවර හෝ වෙළඳ ආයතනයක් ලබා දෙන දැන්වීම් අපි ඉතා ගෞරවයෙන් බාර ගැනිම පමණක් කරමු. මුල පටන්ම සත්‍ය සහ ආචාර ධර්ම මත පමණක් පිහිටා කටයුතු කිරීම අපගේ ඒකායන අරමුණය.

කැඩපත යනු ඔබේ පවුලේ සඟරාවකි. කැඩපත පවුල නැමති ඒකකය තුළ සුභවාදී සොඳුරු කතිකාවතක් ගොඩනගන දිනය වැඩි ඈතක නොවන බව අපි ඉතා නිරහංකාරව මතක් කර සිටිමු.

අවසාන වශයෙන් සන්නස මාසිකය කැඩපත ගැන කියන්නට ලබා දුන් මේ ඉඩකඩ ගැන අපගේ හෘද්‍යාංගම ස්තූතිය පිරිනමමු.

**සාමන්ත තැන්නගේ**

